**රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව - 2021**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය.**

රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාවේ (“සංස්ථාව”) 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව විසින් සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂයපථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සංස්ථාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව සහ

- සංස්ථාව විසින් සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ** | | |
| | සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිශෝධනය කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය තුළ සිදුකරන ලද රු. 5,785,978 ක් වූ පූර්ව වර්ෂයේ ගැලපීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 හි 45 වන වගන්තිය සහ 49 වන වගන්තිය ප්‍රකාරව අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි. | ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ආස්ථිත්‍යය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සංස්ථාව සහතික විය යුතු බව. |

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16**
**දේපල,පිරියත සහ උපකරණ**

| | | |
|---|---|---|
| සංස්ථාව විසින් අඛණ්ඩව භාවිතා කරමින් පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය තිබූ පරිගණක උපාංග සහ මෘදුකාංග, කාර්යාලීය ගෘහ භාණ්ඩ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, මෝටර් වාහන සහ අනෙකුත් වත්කම් පිරිවැය පිළිවෙලින් රු. 8,521,619, රු.7,355,774, රු.101,121,258, රු.194,103,638 සහ රු.65,999,216 ක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වන වගන්තියේ විධිවිධාන අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීම 2021 වර්ෂයේ සිදුකර ඇති අතර තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගැනීම 2022 වර්ෂය තුලදී සිදුකරනු ඇත. | ආස්ථිත්‍ය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවට සංස්ථාව සහතික විය යුතු බව. |

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 -**
**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන**

| | | |
|---|---|---|
| සංස්ථාවේ පූර්ණ අයිතිය ඇති පරිපාලිත ආයතනය වන Devcoshowa (Pvt) Ltd. දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පවතින අතර 2006 දී සමාගම වසා දැමීමට පාලක මණ්ඩලය තීරණයක් ගෙන තිබුණි . ඈවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණු අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංස්ථාව විසින් සකස් කර නොතිබුණි. | Devcoshowa (Pvt) Ltd. දිගු කලක් තිස්සේ ක්‍රියාකාරී නොවන සමාගමක් වන බැවින් එය සංස්ථාගත කළ දින සිට ඒකාබද්ධ ගිණුම් සකස් කර නොතිබුණි. ඈවර කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී. | ආස්ථිත්‍ය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවට සංස්ථාව සහතික විය යුතු බව. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනතේ 02 වගන්තියට අනුව ආර්ථික සේවා ගාස්තු (ESC) සහ ඊට අදාළ අධිභාර පිළිවෙලින් රු.64,158,593 සහ රු. 13,654,032 ක් ගෙවා හෝ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල | සංස්ථාව මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු (ESC) ගෙවීමට නොහැකි වී ඇත. ESC අධිභාර ඉවත් කරන ලෙස මුදල් අමාත්‍යාංශය මගින් දේශීය ආදායම් | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ක්‍රමවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත් කර වෙත ගෙන හෝ නොතිබුණි. | දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. | |
| (ආ) | විවිධ ණයගැතියන් යටතේ පෙන්වා ඇති වැටුප් හා වේතන පාලන ගිණුමේ හර ශේෂය රු. 80,335,283 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට පියවා නොතිබුණි. | 2022 වර්ෂයේ ගෙවිය යුතු වැටුප් ගිණුම සහ වැටුප් පාලන ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ක්‍රමවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව. |
| (ඇ) | 2020 සහ 2021 වර්ෂ සඳහා සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් සඳහා පනවා ඇති රු. 25,871,900 ක අධිභාරය මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | EPF අධිභාරය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ක්‍රමවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බව. |
| (ඈ) | භාණ්ඩාගාරයෙන් ලැබුණු රු. 53,000,000 ක ප්‍රාග්ධන ප්‍රදානය, රජයේ ප්‍රදානයක් ද ණයක් ද යන්න තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | COVID කාලසීමාව තුළ පුනරාවර්තන ප්‍රදානයක් ලෙස රු. 53,000,000 ක් ලබා දී ඇති අතර ගිණුම්වල මෙය පුනරාවර්තන ප්‍රදානයක් ලෙස නිවැරදි කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගනුදෙනු සහ වටිනාකම සතුටුදායක ලෙස තහවුරු කිරීමට සහ පිළිගැනීමට විගණනය සඳහා සියලුම ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැතිවීම

පහත ශේෂයන් සඳහා උපයෝගී ලේඛන ඉදිරිපත් කර නොතිබූ බැවින්, එම ශේෂවල නිරවද්‍යතාවය සහ වලංගුභාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

| | ගිණුම් අයිතමය | වටිනාකම රු. | සාක්ෂි නොමැති | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ණයහිමි ශේෂය | 43,829,527 | කේවල උපලේඛන සහ වයස් විශ්ලේෂණය | වටිනාකම රු.43,829,526 ක් වූ ණයහිමි ශේෂය දීර්ඝ කාලයක් තිස්සේ හඳුනා නොගත් අතර ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට වාර්තාවක් ඉදිරිපත් කෙරේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගනුදෙනු සහ වටිනාකම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය සහ පිළිගැනීමට හැකිවන පරිදි විගණනය සඳහා සියලුම ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ණයවර ලිපි ආන්තික ගිණුම | 114,127,998 | විස්තරාත්මක උපලේඛන | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගනුදෙනු සහ වටිනාකම් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය සහ පිළිගැනීමට හැකිවන පරිදි විගණනය සඳහා සියලුම ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) | උප කොන්ත්‍රාත් අත්තිකාරම් | 15,299,042 | විස්තරාත්මක උපලේඛන | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඈ) | ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 131,756,060 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | වෙළඳ ණයහිමි - හර ශේෂ | 19,393,442 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඊ) | විවිධ ණයහිමියෝ හර ශේෂ | 2,620,086 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (උ) | විවිධ ණයගැතියෝ | 29,563,152 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඌ) | විවිධ ණයහිමියෝ | 278,652,082 | විස්තරාත්මක උපලේඛන සහ කාල විශ්ලේෂණය | දීර්ඝ කාලයක් තිස්සේ හඳුනා නොගත් ගෙවිය යුතු දෑ පිළිබඳ ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට වාර්තාවක් ඉදිරිපත් කෙරේ. | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු දෑ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයගැති ශේෂය රු. 587,623,905 ක් වසර 03 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හැර එම ණයගැතියන් අයකර ගැනීමට | සංස්ථාව ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

| නීති, රීති, සහ රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2018 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 01/2018 | රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛයට අනුව මෝටර් වාහන මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා ගත යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රු. 4,350,000 ක් වටිනා බස් රථයක් මිලදී ගැනීම සඳහා එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | සේවකයින්ට ප්‍රවාහනය සැපයීමේ හදිසි අවශ්‍යතාවයක් ලෙස COVID කාල සීමාව තුළ බස් රථය මිලදී ගැනීම සිදු කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව 2022 මැයි 02 වන දින රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ලිපියක් යවා ඇත. | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල වීම කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක: DMA/2009(2) හා 2009 ජූලි 01 දිනැති චක්‍රලේඛය | වත්කම් ලේඛනයේ අවශ්‍ය විස්තර ඇතුළත් කර නොතිබුණි. | 2022 වර්ෂයේ වත්කම් නැවත තක්සේරු කිරීමත් සමඟ අවශ්‍ය සියලු විස්තර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරමින් පවතී. | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල වීම කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතුය. |

## 1.8 මූල්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු ණය මුදල රු. මිලියන 1,844 ක් වූ අතර එම ණය සඳහා පොලී වියදම රු. මිලියන 200 ක් විය. පෙර වර්ෂයට සාපේක්ෂව ණය වටිනාකම රු. මිලියන 415.67 කින් එනම් සියයට 29 කින් ඉහළ ගොස් ඇති බැවින්, ඉදිරියේදී ව්‍යාපෘති මගින් ප්‍රමාණවත් ලාභයක් උපයා ගැනීමට | විගණන නිරීක්ෂණය නිවැරදියි. කාරක ප්‍රාග්ධන අවශ්‍යතා හේතුවෙන් සංස්ථාවට පසුගිය වසරවල විශාල ණය ප්‍රමාණයක් ලබා ගැනීමට සිදු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම ණය සඳහා විශාල පොලී | සුදුසු උපක්‍රම භාවිත කරමින් පොලී වියදම් අවම කර ගැනීමට ක්‍රියා කළ යුතු බව. |

| | |
|---|---|
| සංස්ථාව අපොහොසත් වුවහොත් මූල්‍ය තත්ත්වය තවදුරටත් දුර්වල වනු ඇති බව නිරීක්ෂණය විය. | මුදලක් ගෙවීමට සංස්ථාවට සිදු විය. |

**1.9 බදු රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකතුව රු. 1,111,086,511 ක් වූ එකතු කළ අගය මත බද්ද 2002 වර්ෂයේ සිට ගෙවා නොතිබුණි. | සංස්ථාව මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් VAT සහ NBT නිරවුල් නොවී පැවතුනි. | සංස්ථාව බදු නීතියට අනුකූල විය යුතු බව. |
| (ආ) | එකතුව රු. 6,342,105 ක්වූ ජාතික සංවර්ධන බද්ද 2021 දෙසැම්බර් 31 දින වනවිට වර්ෂ දහයකට වැඩි කාලයක සිට පියවීමකින් තොරව පැවතුනි. | සංස්ථාව මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් VAT සහ NBT නිරවුල් නොවී පැවතුනි. | සංස්ථාව බදු නීතියට අනුකූල විය යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු හේතුවෙන් බදු පෙර ශුද්ධ ලාභය රු. 43,124,611 ක් වූ අතර එය පෙර වර්ෂය සඳහා වූ රු. 257,420,711 ක බදු පෙර ශුද්ධ අලාභයට සාපේක්ෂව රු.300,545,322 ක සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කර තිබුණි. ආදායම වැඩි වීම සහ අනෙකුත් වියදම් අඩුවීම මෙම මූල්‍ය ප්‍රතිඵලය ඉහළ යාමට ප්‍රධාන හේතුව විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 265.69 ක පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති හයක් නිම කිරීමට අපේක්ෂා කර තිබුණද තථ්‍ය ප්‍රගතිය සියයට 65 ට අඩු විය. | රටේ පවතින Covid 19 තත්ත්වය, ද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතා, පාරිසරික ගැටළු, සැලසුම්ගත ඉදිකිරීම් කටයුතුවල වෙනස්කම් සහ ගිවිසුමේ වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |

| | | | |
|---|---|---|---|
| | | ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇත. | |
| **(ආ)** | වටිනාකම රු. මිලියන 2,184.85 ක් වූ ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘති 144 ක් අපේක්ෂිත භෞතික ව්‍යාපෘති ප්‍රගතිය දක්වා නොතිබුණු අතර, ඉන් රු. මිලියන 1,108.82 ක් වටිනා ව්‍යාපෘති 72 ක සමාලෝචිත වර්ෂය අවසන් වන විට සත්‍ය ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු බව දක්වා තිබුණි. | රටේ පවතින Covid 19 තත්ත්වය, ද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතා, පාරිසරික ගැටළු, සැලසුම්ගත ඉදිකිරීම් කටයුතුවල වෙනස්කම් සහ ගිවිසුමේ වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇත. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |
| **(ඇ)** | වටිනාකම රු. මිලියන 839.68ක් වූ මාර්ග ව්‍යාපෘති හයක් 2021 වර්ෂය නිම කිරීමට අපේක්ෂා කර තිබූ අතර, මෙම ව්‍යාපෘති 2021 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | රටේ පවතින Covid 19 තත්ත්වය, ද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතා, පාරිසරික ගැටළු, සැලසුම්ගත ඉදිකිරීම් කටයුතුවල වෙනස්කම් සහ ගිවිසුමේ වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇත. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |
| **(ඈ)** | වටිනාකම රු. මිලියන 416.89 ක් වූ 2020 වසර වන විට සම්පූර්ණ කළ යුතුව තිබූ ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති හයක් 2021 දෙසැම්බර් 31 දක්වා නිම කර නොතිබූ අතර එහි භෞතික ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 වන විට සියයට 60 ට වඩා අඩු විය. | රටේ පවතින Covid 19 තත්ත්වය, ද්‍රව්‍ය සොයා ගැනීමේ දුෂ්කරතා, පාරිසරික ගැටළු, සැලසුම්ගත ඉදිකිරීම් කටයුතුවල වෙනස්කම් සහ ගිවිසුමේ වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇත. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |
| **(ඉ)** | වටිනාකම රු. මිලියන 42.36 ක් වූ ජල සම්පාදන හා වාරිමාර්ග | රටේ පවතින Covid 19 තත්ත්වය, ද්‍රව්‍ය සොයා | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියක් 2020 අප්‍රේල් 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණු අතර එහි භෞතික ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 වන විට සියයට 75 ක් පමණක් විය. | ගැනීමේ දුෂ්කරතා, පාරිසරික ගැටළු, සැලසුම්ගත ඉදිකිරීම් කටයුතුවල වෙනස්කම් සහ ගිවිසුමේ වෙනස්කම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත මට්ටමට ළඟා වීමට නොහැකි වී ඇත. | |
| (ඊ) | ව්‍යාපෘති 42 කින් 2021 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 189,977,006 ක අලාභයක් හඳුනාගෙන තිබුණි . | රටේ පවතින COVID 19 වසංගතය හේතුවෙන් මුහුණ දෙන දුෂ්කරතා, පාරිභෝගික ගෙවීම් ප්‍රමාදය, පාරිසරික ගැටලු (ගංවතුර), අධික ද්‍රව්‍යමය පිරිවැය සහ සංස්ථාව මුහුණ දුන් මූල්‍ය දුෂ්කරතා පාඩු ලබන ව්‍යාපෘති සඳහා ප්‍රධාන හේතු විය. | සැලසුම්වලට අනුව කටයුතු කළ යුතු බව . |

### 3.2 ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රත්මලාන ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සිදුකළ භෞතික පරීක්ෂාව අනුව රු. 10,392,151 ක් වටිනා භාවිතයට නොගන්නා යන්ත්‍ර හා උපකරණ පවතින බව නිරීක්ෂණය විය. | මෙම භාවිත කළ නොහැකි වත්කම් විකිණීමට දැනටමත් කටයුතු යොදා ඇත. | වත්කම් නිසිලෙස පරිහරණය කිරීමට කටයුතු කළ යුතු බව. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යා 489 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 634 ක් විය. ඒ අනුව සංස්ථාවට විවිධ තනතුරු සඳහා සේවකයින් 145 | සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය. | තථ්‍ය සේවක සංඛ්‍යා මට්ටම් තහවුරු කර ගැනීමට කාලීන පදනමින් සමාලෝචනය කර පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකු අතිරේකව බඳවාගෙන තිබුණු බව නිරීක්ෂණය විය. | | |
| **(ආ)** | 2021 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව තනතුරු දෙකක් පුරප්පාඩු වී තිබුණි | මෙම පුරප්පාඩු දෙක පිරවීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇත. | තථ්‍ය සේවක සංඛ්‍යා මට්ටම් තහවුරු කර ගැනීමට කාලීන පදනමින් සමාලෝචනය කර පියවර ගත යුතු බව. |
| **(ඇ)** | සිවිල් ඉංජිනේරුවන් සඳහා අනුමත සේවක සංඛ්‍යාව 19ක් වූ නමුත් සිවිල් ඉංජිනේරුවන් 85 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | සිදු කරන ලද ඉදිකිරීම් කටයුතුවල ශ්‍රම අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය. | තථ්‍ය සේවක සංඛ්‍යා මට්ටම් තහවුරු කර ගැනීමට කාලීන පදනමින් සමාලෝචනය කර පියවර ගත යුතු බව. |
| **(ඈ)** | අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ආරක්ෂක නිලධාරීන් 22 දෙනකු බඳවාගෙන තිබුණි. | දිවයිනේ විවිධ ප්‍රදේශවල ව්‍යාපෘති ස්ථානවල වත්කම් ආරක්ෂා කිරීම සඳහා 2021 වර්ෂයේදී ආරක්ෂක නිලධාරීන් බඳවා ගැනීමට සංස්ථාවට සිදු විය. | තථ්‍ය සේවක සංඛ්‍යා මට්ටම් තහවුරු කර ගැනීමට කාලීන පදනමින් සමාලෝචනය කර පියවර ගත යුතු බව. |